පටිසඞ්ඛාවිපස්සනා (දෙවෙනි කොටස)
06.10.2019 - ශ්‍රී ලංකාරාමය
නවසීලන්තය

හොඳයි, අපි ඊයේ අපි ගාථා දෙකක් කිව්වා. එකක් තමයි

වත්ථුසඞ්කමනා චෙව - සඤ්ඤාය ච විවට්ටනා
ආවජ්ජන බලඤ්චෙව - පටිසඞ්ඛා විපස්සනා

පටිසඞ්ඛා විපස්සනාව කියන එකයි මේකෙන් හඳුන්වා දෙන්නේ. **වත්ථුසඞ්කමනා** කියලා කිව්වේ අපිට මෙනෙහි කරන්න මොකක් හෝඅරමුණක් එනවා, ඒක දකින එකක් හෝ අහන එකක් හෝ වේදනා සංඥා සංඛාර හෝ මොකක් හෝ දෙයක් වෙන්න පුළුවන්. අපි බලන්න ඕනෑ ඒකෙ අනිත්‍යය. ඒ අරමුණේ අනිත්‍යත්වය, වෙනස් වීම බලලා ඊට පස්සේ ඉක්මනටම හැරෙන්නේ ඕනෑ ඒ අරමුණ වෙනස් වෙන බව දැකපු හිතට. ඉස්සරවෙලා අරමුණේ වෙනස් වීම දැකපු සිතෙත් වෙනස් වීම දකින්න ඕනෑ. ඒක ඉක්මනට කරගන්න ඕනෑ. අරමුණෙන් ඉක්මනට අරමුණ දැක්ක හිත පැත්තට පැන ගන්න ඕනෑ. ඒකට කියනවා **වත්ථුසඞ්කමනාව** කියලා. (එහා වස්තුවෙන් මෙහා වස්තුවට සංක්‍රමණය වීම) **සඤ්ඤාය ච විවට්ටනා** කියලා කිව්වේ ඒ අරමුණේ පරිවර්තනය වීමට. මෙන්න මේකට කියනවා **පටිසඞ්ඛා විපස්සනාව** කියලා.

ඊළඟට කිව්වා තව ගාථාවක්

ආරම්මණං අන්වයෙන - උභො එකවවත්‍ථනා
නිරොධෙ අධිමුත්තත්තා - වයලක්ඛණ විපස්සනා.

මෙහි **අන්වය** කියලා කිව්වේ 'ක්‍රමය', 'ඒ අනුසාරයෙන්' කියන එක. ඉස්සෙල්ලා අපි දැක්කා අරමුණ වෙනස් උනා, ඒ අරමුණ බලපු සිතත් වෙනස් උනා. ඒ වර්තමානයේ. ඊට පස්සේ අතීතයට යනවා. අතීතයට ගිහිල්ලා අතීතයෙත් ඒ සිදුවීම එහෙමමයි කියලා බලනවා. අනාගතයටත් බලනවා, ඒත් ඒ සිදුවීම ඒ විදියටයි. **'උභො'** කියලා කියන්නේ අතීතයයි අනාගතයයි දෙක. ඒ දෙකත් ඔය විදියට බලනවා. මෙහිදී හැම තැනම නිරෝධය පේන නිසා කැඩී යෑම බිඳී යෑම පේන නිසා ඒකට කියනවා විනාස වී යෑම දැකීමේ **අධිමුත්තත්තාවය** (බැසගත්තා) කියලා. ඒකට කියනවා **වයලක්ඛණ විපස්සනාව** කියලා. මේ විපස්සනාවේදී හැම තැනම කඩා බිඳීම තමයි පේන්නේ.

ආරම්මණඤ්ච පටිසඞ්ඛා - භඞ්ගඤ්ච අනුපස්සති
සුඤ්ඤතො ච උපට්ඨානං - අධිපඤ්ඤා විපස්සනා

ආරම්මණඤ්ච පටිසඞ්ඛා = අරමුණේ බිඳී යෑම නුවණින් දැන.
භඞ්ගඤ්ච අනුපස්සති = එය දකින සිතේද බිඳී යෑම නුවණින් දැන
සුඤ්ඤතො ච උපට්ඨානං = ශුන්‍ය වශයෙන් වැටහී යයි
අධිපඤ්ඤා විපස්සනා

මෙහෙම දකින කොට මොකක්ද වෙන්නේ? මේක දකින කොට පුද්ගලයෙක් හැටියට හරි දෙවියෙක් හැටියට බ්‍රහ්මයෙක් හැටියට කිසිම දෙයක් තිබෙනවා කියලා හිත බාර ගන්නේ නෑ. එහි තිබෙන්නේ බිඳී බිඳී කැඩී කැඩී යන්නා වූ සංස්කාර ස්වභායක් පමණයි, සත්ව පුද්ගල කිසිවක් නෑ කියලා දකිනවා.

මෙහෙම එකක් තිබෙනවා, සංස්කාරයෝ සහ සත්වයෝ පුද්ගලයෝ කියලා කියන්නේ ධර්මතා දෙකක්. සංස්කාරයෝ ටිකක් අල්ලාගෙන තමයි සත්වයෝ පුද්ගලයෝ කියන එක අපි හයිකරන්නේ. සත්වයෝ පුද්ගලයෝ කියලා කිසිවක් නෑ, සංස්කාරයෝ ටිකක් පමණක් තිබෙනවා. ඒ සංස්කාරයෝ තිබෙන නිසා තමයි ඒවා පේන්නේ. දැන් අපි මෙනෙහි කරනකොට නාම ධර්මයෝ සහ රූප ධර්මයෝ තිබෙන බව පේනවා, නමුත් එතැන සත්වයා පුද්ගලයා තමයි නැත්තේ. එතකොට එතැන ශූන්‍යයතාවයක් තිබෙනවා. මොකකින්ද ශූන්‍යය වෙන්නේ? සත්වයෙක් පුද්ගලයෙක් නැති බැවින් ශූන්‍යයයි, නමුත් සංස්කාර වලින් ශූන්‍යය නෑ.

අර වැලි වලින් හදපු අලියා වගේ. වැලි වලින් අලියෙක් හදලා අලියා කියලා හිතා ගන්නවා. නමුත් එතැන තිබෙන්නේ වැලි. අලියා කැඩුවයින් පස්සේ වැලි තිබෙනවා නමුත් අලියා නෑ. අන්න ඒ වගේ කැඩිලා බිඳිලා යන සංස්කාරයෝ ටිකක් නම් තිබෙනවා. සත්වයෙක් පුද්ගලයෙක් නෑ.

රහතන්වහන්සේලාටත් සංස්කාරයෝ පේනවාද? රහතන්වහන්සේලාටත් සංස්කාරයෝ පේනවා. රහතන්වහන්සේලාට පේන්නේ නැත්තේ සත්වයෝ පුද්ගලයෝ. සත්වයෝ පුද්ගලයෝ කියන ගතිය එතැන නෑ. රහතන්වහන්සේලා ඒ සත්ව පුද්ගල සංඥාව අයින් කරලා තිබෙන්නේ. ආන්න ඒවගේ මේ විපස්සනාව වඩන කොට මේ බිඳීම, වෙනස් වී යෑම, කැඩීම දැක දැක මෙනෙහි කරමින් යනකොට හිතට දැනෙනවා ශූන්‍ය බවක් = (සුඤ්ඤතො ච උපට්ඨානං). **සුඤ්ඤතො ච උපට්ඨානං** කියලා කියන්නේ එළඹෙන සියල්ලක්ම ශූන්‍ය වශයෙන් තමයි මතුවෙන්නේ, සත්වයෝ පුද්ගලයෝ හැටියට නොවෙයි. නමුත් සංස්කාර නෑ කියලා පේන්නේ නෑ. සංස්කාර ටිකක් පේනවා. ඒ සංස්කාර ගොඩේ සත්වයෙක් පුද්ගලයෙක් ආත්මයක් ජීවයක් මොක්කවත්ම නෑ.

1. **ආරම්මණඤ්ච පටිසඞ්ඛා** = අරමුණේ බිඳී යෑම නුවණින් දැන.
2. **භඞ්ගඤ්ච අනුපස්සති** = එය දකින සිතේද බිඳී යෑම නුවණින් දැන.
3. **සුඤ්ඤතො ච උපට්ඨානං** = සූන්‍ය වශයෙන් වැටහී යයි යන කාරණා තුන සහිත මනසිකාරයට කියනවා **අධිපඤ්ඤා විපස්සනාව** කියලා.

දැන් විපස්සනා තුනක් කියලා දුන්නා. **පටිසඞ්ඛා විපස්සනාව - වයලක්ඛණවිපස්සනා** සහ **අධිපඤ්ඤා** විපස්සනාව කියලා. එකම විපස්සනාවේ පැතිකඩ තුනක් තමයි ඔය කියලා දුන්නේ. මේ බිඳී යෑම, කැඩී යෑම, වෙනස් වී යෑම බැලීම ඒ තරමම වටිනවා.

දැන් අපි භාවනා කරගෙන යනකොට භාවනා කරන කරුණු **3** තිබෙනවා. විපස්සනා වශයෙන් භාවනා කරනකොට අපිට වැටහෙන්න ඕනෑ මේවා කැඩිලා බිඳිලා යනවා කියලා. ඒකට කියනවා **අනිත්‍යානු පස්සනාව** කියලා. දෙවෙනි කරණය තමයි යමක් අනිත්‍ය නම් එතැන කිසි සතුටක් ඇතිකරගන්න දෙයක් නෑ. ඒ තමයි දුක. දුකක් දැනෙන්න ඕනෑ. තුන්වෙනි කාරණය තමයි යම්කිසි තැනක වෙනස් වීමක් තිබෙනවා නම් දුකකුත් තිබෙනවා නම් එතැන ආත්මයකුත් නෑ.

විපස්සනා භාවනාවේදී මේ කාරණා (3) දැනෙනවා

- භය වශයෙන් දැකීම.
- වය වශයෙන් දැකීම.

} මේ දෙක **අනිත්‍යානුපස්සනාවයි** - (1)

- ශූන්‍ය වශයෙන් දැකීම } මෙය **අනත්තානුපස්සනාවයි** - (2)

යම්කිසි ධර්මයක් මෙනෙහි කරමින් යනකොට අපිට පේන්නේ කැඩිලා බිඳිලා යනවා කියලා. **වය** කියලා කියන්නෙත් ගෙවීයනවා කියන එක. ඒකත් අනිත්‍යය වීමක්. ශූන්‍ය වශයෙන් දකිනවා කියලා කියන්නේ සත්වයෝ පුද්ගලයෝ හැටියට බාර ගන්නේ නෑ කියන එක. ඒකට කියනවා **අනත්තානු පස්සනවා** කියලා.

මෙතැන **අනිත්‍යය** තිබෙනවා, **අනාත්තමය** තිබෙනවා නමුත් දුක නෑ. අපි මෙහෙම හිතමු. කාටහරි කැන්සර් එකක් හැදෙනවා. එතකොට මගේ ශරීරය ක්‍ෂය වෙනවා කියලා හිතනවා. නැත්නම් දිරාපත් වෙනවා. මේ ශරීරය කැඩෙනවා නම් බිඳෙනවා නම් මේක ඉවර වෙලා යන්න ළඟනම් ඒක නිසා බයක් දැනෙනවා. ඒ බය නැති කරගැනීමට ඊට පස්සේ දොස්තරවරු හම්බවෙන්න යනවා. බුදුරජාණන් වහන්සේගේ දේශනාව කෙරෙහි පැහැදීම ඇතිවෙනවා. ඒ පැහැදීම ඇතිවෙන්නේ බය නිසා. බය වශයෙන් දැකීමට කියනවා **දුක්ඛානුපස්සනවා** කියලා.

- බය වශයෙන් දැකීම.
- වය වශයෙන් දැකීම.

} මේ දෙක **අනිත්‍යානුපස්සනාවයි** (1)

- ශූන්‍ය වශයෙන් දැකීම. } මෙය **අනත්තානුපස්සනාවයි** (2)

- බය වශයෙන් දැකීම. } ඒක **දුක්ඛානුපස්සනාවයි** (3)

අනිත්‍යානුපස්සනාව - අනත්තානුපස්සනාව - දුක්ඛානුපස්සනාව කියලා මේ විදියට අනුපස්සනා තුනක් තිබෙනවා. මේකට කියනවා **අධිපඤ්ඤා විපස්සනාව** කියලා.

මේ අධිපඤ්ඤා විපස්සනාව හැදෙන්න හැම වෙලේම අනිත්‍යත්වය පිළිබඳව නිස්සාරත්වය පිළිබඳව බණ අහන්න ඕනෑ, කියවන්න ඕනෑ, හිතන්න ඕනෑ, මෙනෙහි කරන්න ඕනෑ. ලොකු ලොකු දේවල් හැටියට, පොඩි පොඩි දේවල් හැටියට, මධ්‍යම ප්‍රමාණයට, සියුම් ප්‍රමාණයට මෙනෙහි කරන්න ඕනෑ.

සංස්කාරයෝ ශූන්‍ය වශයෙන්, දුක වශයෙන් අපි බලන්නේ නැති නිසා අපි යම් යම් දේවල් පතනවා, විඳිනවා, ආසාවල් ඇති කරගන්නවා, ගොඩක් දේවල් කරනවා. අපි එහෙම කරන්නේ කිසිම දෙයක් වෙනස් වෙනවා කියලා අපේ හිත බාර ගන්නේ නැති නිසා. හිතන්න බලන්න, ගෙයක් ගන්න කොට ඉස්සෙල්ලාම දකින්නේ advertisement එක. ඒක හරිම ලස්සනයි දිව්‍යලෝකයක් වගෙයි. ඉතින් ගොඩක් බලාපොරොත්තු ඇතුව යනවා. ගිහිල්ලා බලනකොට පේනවා දිරාපත් වෙච්ච වැස්සට තෙමිච්ච තාවකාලික board ගහපු ඒකට උඩින් paint ගාපු තැන්. අපි යනකොට යන්නේ ඒ ගෙදර ගන්න බලාගෙන. ඒ උනාට පරණ වෙච්ච ජරා වෙච්ච තැන් දැක්කහම අපේ හිතේ තිබුණ කැමැත්ත නැති වෙලා යනවා. ඒ කැමැත්ත නැති උනේ ඇත්තටම ඒකෙ තිබුණ විනාසය දැකපු නිසයි. ඒකට කියනවා නන්දිය අයින් කරනවා කියලා. නන්දිය කියලා කියන්නේ සතුටු වෙන ගතිය, ආසාව. ඒ ගෙය සමග බැඳී තිබුණ අනිකුත් සියලුම බලාපොරොත්තු ඒ හා සමගම නැති වෙලා යනවා. එවගේම ඒ ගෙදරට නැවත කවදාකවත් ආසාවක් උපදවන්නේ නෑ. බැඳීමකුත් නෑ.

අපේ ජීවිතවල තරුණ කාලයට තිබෙනවා තරුණ මදය කියලා එකක්. ඒ කියන්නේ තරුණ කමින් මත්වෙලා, 'අපි මැරෙන්නේ නෑ, අපි ඉපදිලා ඉන්නේ මේ ලෝකයේ අයුක්තියට අසාධාරණයට විරුද්ධව නැගී හිටින්නයි' කියන එක තමයි තරුණ කාලෙට තිබෙන්නේ. ඊට පස්සේ පෙළපාළි ගිහිල්ලා රණ්ඩු කරලා ගුටි කාලා තෙමිලා කරදර වෙනකොට ඒ මදය බැහැලා යනවා. අවුරුදු 50 ක් 60 ක් විතර වෙනකොට යුක්තිය අසාධාරණය වෙනුවෙන් නැගී හිටපු කෙනා 'ඕවා ඔහොම තමයි'

කියලා රණ්ඩු වෙන්න යන්නේ නෑ, එහෙම වෙන්නේ එයා ඒ වෙනකොට ඒක තේරුම් ගත්ත නිසා. නමුත් මේ අතර තරුණ මදය නැති තරුණ අයත් ඉන්නවා. ඒ වගේ exceptional අයත් අපි අතර ඉන්නවා.

මදයෙන් මත් වූ කෙනා මේ සංස්කාර ධර්මයන් ග්‍රහණය කරගන්නේ අමුතුම මායාවක් විදියට. පුදුම විදියේ මායාකාරී මුලාවක තමයි ඒ මනස තිබෙන්නේ. ඒවගේ මනසකට මේ ලෝකයේ තිබෙන දේවල් වෙනස් වෙනවා කියන හැඟීම එන්නේ නෑ. ජීවිත මදයත් ඒ වගේ. ජීවත් වෙලා ගොඩක් කල් ඉන්න අයටත් ජීවිත මදය තිබෙනවා. මේ වස්තු වල අනිත්‍යත්වය පෙන්නේ නැති ගතිය සමහර අයට තද බල විදියට තිබෙනවා. නමුත් ඒක තමයි ඇත්ත. ඒක නිසා අපි මුලා වෙන්නේ නැතුව මේ ඇත්ත තත්වය දකින්න ඕනෑ. අපි මොනවා හරි ලැබේවා කියලා පැතුවොත් අපිට ඔක්කෝම ලැබෙන්නේ අනිත්‍යතත්වයෙන් යුක්ත වෙච්ච දේවල්මයි.

තවත් එකක් තිබෙනවා, ඒක භයානකයි. දැන් අපිට අනිත්‍යය ගැන, දුක ගැන මේ විදියට සාකච්ඡා කරන්න, කථා කරන්න හම්බ උනේ, අවස්ථාව ලැබුණේ ලෝකයේ තිබෙන අනිත්‍යතත්වය, ලෝකයේ තිබෙන ආසරත්වය නිස්සාරත්වය පිළිබඳව හොයලා දැනගෙන අවබෝධ කරගෙන දේශනා කරපු ධර්මයක් ලෝකයේ තිබෙන නිසා. ඒ ධර්මය අපේ හිත් වලට වද්දා ගන්න, කාන්දු කරගන්න, ළංකරගන්න වාසනාව ලැබිලා තිබෙනවා. මනුස්ස ජීවිතිය තමයි ඒකට හොඳම තැන. අපිට ඒ මනුස්ස අවස්ථාවත් හම්බ උනා, ඒ ධර්මයත් හම්බ උනා. ඒක නිසයි අපි මේක අහගන්නේ. ඒ වාසනාවයි අපිට තිබෙන්නේ. නමුත් අපි යම්කිසි විදියකින්වත් තිරිසන් ලෝකයකට ගියොත් අපායකට ගියොත් මේ වගේ ධර්මය අහන්න තිබෙන අවස්ථාවල් මග හැරී යනවා කියන එක කෝටි ගණන් වලින් වැඩි වෙනවා. තිරිසන් ලෝකයට ගියාට පස්සේ බොහෝම කලාතුරකින් තමයි ආයෙත් මේ මනුස්ස ලෝකයට එන්නේ. ඒකට හේතුව ඒකෙම ඒකෙම සත්වයෝ හැටියට උපාදානය වෙනවා. උපාදනය වෙවී උපාදනය වෙවී තිරිසන් ලෝකයේම දුවනවා. තිරිසන් ලෝකයෙන් ප්‍රේත ලෝකයට, ප්‍රේත ලෝකයෙන් තිරිසන් ලෝකයට මාරුවෙනවා. තිරිසන් ලෝකයේ බොහෝ කල් ඉඳලා ප්‍රේත ලෝකයේ බොහෝ කල් ඉඳලා මනුස්ස ලෝකයට ආවත් එයා මෙහෙදිත් දියුණු කරන්නේ තිරිසන් ලෝකයේ ප්‍රේත ලෝකයේ කරපු දේවල්මයි. ආපහු යන්නෙත් හිටපු තැනටමයි. ඒකයි භායනක. අපි හිතමු ආත්ම 100 ක් තිරිසන් ලෝකයේ ඉඳලා මනුස්ස ලෝකයට ආවහම පුරුද්ද තිබෙන්නේ තිරිසන් ලෝකයේ පුරුද්ද. එතකොට මෙහෙ ඇවිල්ල ඉන්න මේ අවුරුදු 70 ට 80 ට එහෙ කරපු දේවල් තමයි එයා කරන්න යන්නේ. ඒ ලෝකයේ හිටිය හැටියට තමයි මෙහෙත් ඉන්න යන්නේ. එහෙදි තිබුණ කෙලෙස් තමයි දියුණු කරන්නේ. නැවතත් මැරිලා ගිහිල්ලා උපදින්නේත් තිරිසන් ලෝකයේ හෝ ඊට සමාන තැනක. භයානකත්වය ඒකයි. ඒක හරිම භයානකයි. ඒක නිසා සංසාරයේ රැඳෙන්න තිබෙන අවස්ථාව වැඩියි. සංසාරයෙන් එගොඩ වෙන්න තිබෙන අවස්ථාව හරි අඩුයි. අපිට පොඩි ඉඩකඩකින් තමයි පැනගෙන යන්න තිබෙන්නේ.

දැන් මේ මනුස්ස ජීවිතිය කියන පොඩි ඉඩකඩින් බුද්ධ සාසනය කියන මේ පොඩි ඉඩකඩින් අපි එළියට පැන ගන්න ඕනෑ. එහෙම නැති උනොත්, මේ අවස්ථාව මග හැරුනොත් එහෙම ආයිත් යන්නේ අතෙන්ට. ප්‍රේත ලෝකයට ගියත් ඒවගේ. අපි හිතාගෙන ඉන්නවා අපි ඔක්කොම ඒ පැත්තට යන්නේ නෑ කියලා. අපි හිතාගෙන ඉන්නවා අපිට දිව්‍යලෝකයේ තමයි seats allocate වෙලා තිබෙන්නේ කියලා. ඒක කොච්චරක් දුරට guarantee ද? ඒක නිසා මේ අනිත්‍යතත්වය කියන එක නිතර මෙනෙහි කරලා මෙනෙහි කරලා දුක්ඛත්වය මෙනෙහි කරලා මේ අවාසනාවන්ත අසාරත්වය මෙනෙහි කරලා මේකෙන් පැන ගන්න ඕනෑ.

භාවනා වැඩ සටහනකදීත් එදිනෙදා වැඩ කටයුතු කරත්දීත් අනිත්‍යය වශයෙන් මෙනෙහි කිරීම - අනාත්ම වශයෙන් මෙනෙහි කිරීම - දුක්ඛ වශයෙන් මෙනෙහි කිරීම තිබෙන්න ඕනෑ. මේ භාවනාව

මෙහෙම කිව්වාට මේක හරි ගැඹුරුයි. අරමුණයි හිතයි - අරමුණයි හිතයි හොඳට දකින්න, මෙනෙහි කරන්න හොඳ හයියක් තිබෙන්න ඕනෑ. හොඳ වේගවත් මනසිකාරයක් තිබෙන්න ඕනෑ. ඒකටයි **ආවර්ජ්ජන බලය** කියලා කියන්නේ.

විදර්ශනා කිරීමේදී මේ අවස්ථාව බොහෝම ගැඹුරු විදර්ශනාවක්. මෙලෙස විදර්ශනා කරන එක්කෙනාට තිබෙනවා ආනිසංස කීපයක්. මේ භාවනාව කරන කෙනා දෘෂ්ඨි ගත වෙන්නේ නෑ. බුදුරජාණන්වහන්සේ නිවන ගැන දේශනා කරන තැනක තිබෙනවා මෙන්න මෙහෙම දෙයක්. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා " මහණෙනි, මෙන්න මෙහෙම ධර්මයක් තිබෙනවා" කියලා. නිවන ගැන කියන්න බෑ, ඒක බුදුරජාණන් වහන්සේ අවබෝධ කරගත්ත දේ. මිනිස්සුන්ට නිවන් දැකලා නිවන් අත්විඳලා හුරුවක් නෑ. මිනිස්සුන්ට තිබෙන්නේ අහපු දේවල් දැකපු දේවල් මේ සසරේ දේවල් පිළිබඳ ඇලීම් එකතුවක්. නිවන් දැකපු නැති එක්කෙනෙකුට නිවන ගැන කියන්න බෑ.

බුදුරජාණන්වහන්සේ මේ විදියට හිතලා තිබෙනවා. මේක එක ගාථාවක තිබෙනවා. ඒ තමයි, "හේතුවකින් හටගන්නා ධර්ම ස්වභාවයක් තිබෙනවා නම් අනිවාර්යෙන්ම හේතුවකින් හට ගන්නේ නැති ධර්මයකුත් තිබෙන්න ඕනෑ" කියලා. ඒ තමයි අසංඛත ධාතුව. සංඛත ධර්ම තිබෙනවා නම් අසංඛත ධාතුවකුත් තිබෙන්න ඕනෑ. මේ අසංඛත ධාතුවේ තිබෙන ස්වභාවය තමයි එහි රූප නෑ. රූප හේතු වලින් හටගන්නා ධර්ම. හේතු වලින් හටගන්නා දේවලුයි හේතු වලින් හට නොගන්නා දේවලුයි එක සමාන වෙන්නේ නෑ. ඒක නිසා අපිට තිබෙන රූප - මේ පාට - මේ උස මහත - අසංඛත ධාතුවේ නෑ. හැඩ වැඩ බලනවා, ඇලෙනවා වගේ නා නා ප්‍රකාර දේවල් තිබෙන්නේ මේ සංඛත ධර්ම තිබෙන තැන. අසංඛත ධර්ම වල ඒක නෑ. සිතක් නෑ, විඤ්ඤාණයත් නෑ, සංඥාවක් නෑ, වේදනාවක් නෑ, විඳීමක් නෑ, විඳින කෙනෙක් නෑ.

විඳින කෙනෙක් නැති එක හොඳයිද නරකයිද? හොඳයි. ඒක හොඳයි කියලා බාර ගන්නේ මොන පදනමක් මතද? අපි ඇත්තටම බලන්න ඕනෑ මේ විඳින ගතිය කියන වේදනාව තිබෙන නිසා නේද අපි මේ විඳවන්නේ කියලා. අපිට විඳවන්න වෙලා තිබෙන්නේ මේ වේදනාව කියන ධර්මය අපිතුල තිබෙන නිසා. ඒක නැති උනානම්, ඒක නැති තැනක් තිබෙනවා නම් ආයිමත් විඳවන්නේ නෑ. ඒක නිසා විඳවන ගතිය හෙවත් මේ වේදනා ගතිය කරදරයක්. මේ වේදනා ගතිය ඇතිවෙන්නෙත් හේතුවකට යටත්වයි. නමුත් නිවනේ වේදනාවක් නෑ. සංඥා සටහන් එන්නෙත් මේ හේතු-ඵල ධර්ම තිබෙන හින්දා. නමුත් නිවනේ මේ එකක්වත් නෑ. සංස්කාර එකතු වීමකුත් නෑ. ඒක නිසා නිවන් දැක්කයින් පස්සේ නෑදැයෝ ටික ඔක්කෝමත් නෑ. නමුත් නෑදැයින් අතහරිනවා කියන එක අමාරු වැඩක්. විශේෂයෙන්ම දරුවන්ගේ ළමයි අතහරින්න හරිම අමාරුයි. ඇත්තටම අපිට එහෙම හැඟෙන්නේ සංස්කාර ගැන නොතේරෙන හින්දයි. 'අපේ දුවගේ පොඩි දෙන්නා, පුතාගේ පොඩි දෙන්නා' කියලා හිතෙන්නේ ඒ අය පිළිබඳව ශූන්‍යතාවය පෙන්නේ නැති හින්දයි. ශූන්‍යතාවය දැක්කා නම් ඒ දෙන්නා පොඩි උනා ලොකු උනා කියලා නෑ, එතැන සත්වයෙක් නොවෙයි - පුද්ගලයෙක් නොවෙයි - ආත්මයක් නොවෙයි - දරුවෙක් නොවෙයි කියලා තේරෙනවා. ඒ අයත් හේතු-ඵල ධර්මයක කොටසක් පමණයි.

අසංඛත ධාතුවල එකක් ලෞකිකයි. ඒක අපිට අත් විඳින්න පුළුවන්. අපි ලෞකික සිත් වලින් විඳින හේතු-ඵල ධර්මයන්ට ගොදුරු නොවුන ධර්මයක් තිබෙනවා. අපි ඒක අදත් අත් විඳිනවා. හැබැයි ඒක වින්දා කියලා අපිට වෙච්ච සැපයක් නෑ. හේතුවකින් හැදිච්ච නැති ලෝකෝත්තර ධර්මයකුත් තිබෙනවා. ඒ තමයි ලෝකෝත්තර අසංඛත ධාතුව. අපිට නැති වෙලා තිබෙන්නේ ඒ ලෝකෝත්තර අසංඛත ධාතුවයි. ඒක ප්‍රඥාවෙන් හොයා ගතයුතු අසංඛත ධාතුවක්.

ලෞකික අසංඛත ධාතුව බල්ලෝ බළලුන්ටත් අත් විඳින්න පුළුවන්. නමුත් ඒකෙ නිවන් ගතිය නෑ. නමුත් ඒක ප්‍රයෝජනයි. ඒකෙ උසක් - මහතක් - පාටක් - පරණ වීමක් - අලුත් වීමක් මුකුත්ම නෑ. ලෝකෝත්තර වශයෙන් තිබෙන අසංඛත ධාතුව අවබෝධ කරගත්තේ නැති එක අපිට හානියක්. ලෞකික අසංඛත ධාතුව දැන ගත්තා කියලා අපි දුකින් නිදහස් වෙලා නෑ. ඒ තමයි අහස. අහසට දිගක් පළලක් පාටක් මොකක්වත් නෑ. අහස අත්විඳින්න අපිට භාවනා කරන්න ඕනෑ නෑ. අහස අපිට අවබෝධ කරගන්න පුළුවන්. ඒක එදිනෙදා ජීවිතියේ මොන මොනවා හරි කරගන්න ප්‍රයෝජනවත් වෙනවා. නමුත් අපි දුකින් මිදිලා නෑ. ලෝකෝත්තර වශයෙන් පවතින අසංඛත වූ නිර්වාණ ධාතුවේ රාගයක් ඇලීමක් බැඳීමක් මොකක්වත් නෑ. වැඩීමක් හැදීමක් මොකක්වත් නෑ. ඒක නිසා අපේ මේ ශරීර හැදෙන එක නැති කරන්න මේක තමයි භාවනා ක්‍රමය.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අවකාශයත් රූපයක් හැටියට ගණන් ගන්නවද?

<u>පිළිතුර</u> - ආකාසය රූපයක් හැටියට ගණන් ගන්නවා. ඒකට කියනවා පරිච්ඡේද රූපය කියලා.

රූප 28 ක් හඳුන්වා දෙනවා. රූප 28 හඳුන්වා දීමේදී ආකාසය කියන එක රූපයක් හැටියට සලකනවා. ඒක රූපයක් හැටියට සලකන්නේ ඇත්තටම ඒක රූපයක් වගේ එකක් නිසා නොවෙයි. හේතුව, රූප කට්ටලය තිබීමට ආධාර වෙන ස්වභාවයක් ඒකෙ තිබෙන හින්දයි. දැන් පාන් ගෙඩියක් ගත්තහම ඒක කපන්න පුළුවන්. ඒක කපන්න පුළුවන්කම තිබෙන්නේ ඒ පාන් ගෙඩිය අස්සේ අහස තිබෙන හින්දයි. නැත්නම් පාන් ගෙඩිය කපන්න බෑ. පාන් ගෙඩිය ඇතුලේ තිබෙන අහස හරහා තමයි පිහිය ඇදෙන්නේ. පාන් කපනවා කියලා කියන්නේ ළඟින් තිබෙන රූප ටික අස්සෙන් පිහියක් යවලා ඒ රූප දුරස් කරලා දෙන එක. පරිච්ඡේද රූපය කියලා කිව්වත් ආකාස රූපය කියලා කිව්වත් දෙකම එකයි. උපාදාය රූප 24 න් එකක් තමයි පරිච්ඡේද රූපය කියලා කියන්නේ. අනිත් සියලුම රූප ඇතිවෙනවා නැතිවෙනවා කියලා කියනවා නමුත් ආකාස රූපය එහෙම ඇතිවෙලා නැති වෙන එකක් නොවෙයි. ඒක අනිත් රූප වලට පිහිටා සිටින්නට ආධාර වෙන්නාවූ භූමිගත ධර්ම ස්වභාවයක්. අනිත් රූප අස්සේ මේකත් තිබෙන නිසා තමයි ඒක පරිච්ඡේද රූපයක් කියලා හඳුන්වන්නේ.

මේ භාවනාවට කියන්නේ **භඞ්ගානුපස්සනාව** කියලා. ඒ කියන්නේ සංස්කාරයන්ගේ බිඳීම, සංස්කාරයන්ගේ කැඩීම, සංස්කාරයන්ගේ විනාසය බලන වැඩක් මේක. මෙතැනදී වෙනසක් තිබෙනවා. මේකට කියනවා **අධිපඤ්ඤා විපස්සනාව** කියලා. අපි කියනවා ඇතිවීම නැතිවීම බලනවා කියලා. ඇතිවීම නැතිවීම බලනවට කියනවා **උදයව්‍යය ඥානය** කියලා. උදයව්‍යය ඥානයෙන් පටන් ගත්ත මේ භාවනාව වඩලා වඩලා මෝරලා මෝරලා ඉස්සරහට එන්න එන්න එයාගේ හිත ඇතිවීමට වඩා නැති වීම දිහා බලනවා. ඒ නැතිවෙන තැන දිහා බලන තැන තමයි මේ **භඞ්ගානුපස්සනාව.**

ඇත්තටම මේ ගැන නුවණින් මෙනෙහි කරනොට 'මම මේ ශරීරයක් හැටියට හිතක් හැටියට ඇයි මේක මේ රඳවාගෙන තියාගෙන ඉන්නේ සහ ඇයි මම නැවත මේ වගේ එකක් හදන්න පිං කරන්නේ, ඇයි මම මේවගේ එකක් හදාගන්න උත්සාහ වෙන්නේ, ඇයි මම නැවතත් මව් කුසක් හරහා product එකක් වෙන්නේ, ඇයි මම මේකෙන් අත් මිදෙන්නේ නැත්තේ' කියලා හැඟීමක් ඇතිවෙනවා. නමුත් මේ හැඟීම එන්නේ මේ විදියට භාවනා කළොත් පමණයි. නැත්නම් වෙන්නේ නාම ධර්ම රූප ධර්ම සමුදායට යම්කිසි සංඥාවක්, නිමිත්තක් හයිකරලා ඒ හරහා සංස්කාර ටිකට ඇලෙන එක.

අපි පරණ පාන් කන්නේ කොහොමද? පාන් ගෙනාවහම ඒ පාන් පරණ වෙනවා. එතකොට අපි ඒවා කන්නේ නෑ. ඒ කන්නේ නැති ඒවා හිතෙන් අයින් වෙනවා. ඒවා අපි හිතෙන් ප්‍රතික්ෂේප කරනවා. කවුරුහරි කන්න හැදුවත් කන්න එපා කියලා කියනවා. ඒ පාන් පරණ වෙලා පුස් හැදෙන්න කළින්

අව්වේ දාල වේලනවා. වේලලා ඉවර වෙලා ඒවා කුඩු කරනවා. කුඩු කරලා ඊට පස්සේ මොකක් හරි ගුලියක් හරිගස්සලා පරණ කරලා එපා කියලා අයින් කරපු පාන් කුඩු ඒක වටේට ගානවා. ගාලා බැදලා අලුත් කියලා ගන්නවා. දැන් බලන්න ඒ පරණ දේ අතහරින්නේ නැතුව වෙනස් කරලා ගත්ත ආකාරය. අපි යම්කිසි දේකට සංඥාවක් දෙනවා. සංඥාවක් දීලා ඒකට අගයක් දෙනවා. ඔය වැඩේ තමයි අපි දිගටම කරගෙන යන්නේ. එක එක දේවල් වලට නම් ගහලා අගයන් දීලා value කර කර value කර කර මේක ඉස්සරහට අද්ද අද්ද යනවා. Values දෙන්න දෙන්න අපේ බැඳීම වැඩි වෙනවා. අපේ ආසාවල් ගොඩක් ඇති වෙනවා. එහෙම වටිනාකම් දෙන්න අපි සංඥාවල් එකතු කරනවා.

මම ඒක ගොඩක් දැකලා තිබෙනවා. කවුරුහරි කෙනෙක් විවාහ වෙන්න යනකොට ගෙයක් ගන්න යනකොට තක්සේරු කරන්නා වගේ ඒ විවාහ වෙන්න ඉන්න අයත් ඒ අය ඉන්න පළාත වශයෙන් තිබෙන ඉඩකඩම් වශයෙන් ඉගෙන ගත්තු පාසැල වශයෙන් නෑදැයින් වශයෙන් හැමදේකටම වටිනා කම් දීලා තක්සේරු කරනවා. පළාත් වශයෙන් කියනවානම් Kandy අංගොඩ මුල්ලේරියාව වවුනියාව කියලා ගත්තොත් ඒ පළාත් වල නම් ඇහෙන කොටම අපේ කෙනෙක් නම් වටිනාකමක් දෙන්නේ Kandy වල ඉන්න කෙනෙකුට. ඊට පස්සේ ගිහිපු විශ්වවිද්‍යාල අනුව ඉගෙන ගත්තු දේවල් අනුව හැම එකකටම වටිනාකමක් දෙනවා. මෙහෙම වටිනාකම් දෙන්න දෙන්න අපේ බැඳීම, නන්දිරාගය කියන එක පැන පැන එනවා. නැති තණ්හාවක් නැති ආසාවක් උල්පතකින් වතුර එන්නා වගේ එන්න පටන් ගන්නවා. එහෙම වෙන්නේ ඒ ඒ දේවල් වලට අපි දෙන්නාවූ සංඥාවල් නිසයි. ඔය වැඩේ තමයි අපි කරගෙන යන්නේ. විවාහ වෙන්න අකමැති කෙනෙකු විවාහයට කැමති කරවා ගන්න මේ වගේ හැම දේකටම වටිනා කමක් දීලා ඒ අයට නැති තණ්හාවල් ඒ හිත්වල ඇති කරන්න වෙනවා. එහෙම තණ්හාවල් ඇති කරලා විවාහයක් කරලා දීලා ඊට පස්සේ ඒ අය විඳින වෙදනාවල් වලට වග කියන්න කවුරුත් නෑ. ඒක නිසා මේවා අපි තේරුම් ගන්න ඕනෑ. මෙහෙම බැලුවහම තේරෙනවා අපි ඉන්නේ මුලාවක බව. මේ තමයි අපේ හිත මුලා කරලා සංස්කාරයන්ට බන්දන විදිය, ඒක සංස්කෘතියක් හැටියට ඉදිරිපත් වෙලා තිබෙන විදිය. අපි සංස්කාර නිමිති වල ඇලී බැඳී යන විදියයි මේ. මේ මම කිව්වේ එකක්. හතර වටේම තිබෙන දේවල් ඔය විදියයි.

හොඳයි, මේ විදියට මෙනෙහි කරන ඒකෙ තිබෙන ආනිසංස කීපයක් දැන් මම කියලා දෙන්නම්.

1. දෘෂ්ඨිගත වෙන්නේ නෑ. (සාස්වත දෘෂ්ඨිය ක්‍රියාත්මක වෙන්නේ නෑ)
2. ජීවිත ආසාව නැත.
3. නිතරම අනිත්‍යය බව වෙනස් වෙන බව සිහි කිරීම.
4. පිරිසිදු ජීවිකාව.
5. නොයෙක් වැඩ වල නිරත නොවීම.
6. කිසිම දේකට බය නැති ගතිය.
7. ඉවසීම ඇති බව.
8. අධිකුසල ධර්ම වැඩීමේ අකමැත්තක් නැති බව. (අධිකුසල ධර්ම කියන්නේ භාවනා කිරීම් වැනි දේවල්)

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස සාස්වත දෘෂ්ඨිය කියලා කියන්නේ මොකක්ද?

<u>පිළිතුර</u> - සාස්වත දෘෂ්ඨිය කියලා කියන්නේ දෙයක් ආත්මයක් කෙනෙක් පුද්ගලයෙක් වශයෙන් ලොකුවට හෝ පොඩියට හෝ දිගට හෝ හුස්ම රැල්ලක් වශයෙන් හෝ වලාකුළු ස්වභාවයකින් හෝ ඉන්නවා කියලා පිළිගන්න ගතිය. ආත්ම දෘෂ්ඨිය තමයි බයානක. සක්කාය දෘෂ්ඨිය වැටෙන්නේ සාස්වත දෘෂ්ඨිය යටතට.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ජීවිත ආසාව නැති වෙනවා කියන්නේ මොකක්ද?

<u>පිළිතුර</u> - ඒ කියන්නේ අපි හිතමු කෙනෙකුට මහා භයානක ලෙඩක් හැදිලා කොහොමත් මැරෙනවා කියලා දැනගන්නවා. ඊට පස්සේ බාරහාර වෙනවා, පඬුරු ගැට ගහනවා. ඒ කියන්නේ ජීවිත ආසාව තිබෙනවා කියන එක. කැඩි කැඩී බිඳි බිඳී යන්නාවූ මේ සංස්කාර කුට්ටිය දික් ගස්සා ගන්න කරන උත්සාහයක් ඒක.

ඇත්තවශයෙන්ම මෙතැනදී කථා කරන්නේ සාමාන්‍ය ජීවිතියක් ගැන නොවෙයි, විපස්සනාවක් ගැනයි මේ කථා කරන්නේ. හැමදේම බිඳිලා බිඳිලා කැඩිලා යනවා, හිතත් බිඳෙනවා, බලන බලන දේත් බිඳෙනවා කියලා මේ විදියට අධිපඤ්ඤාව තිබෙන්නා වූ කෙනා, විපස්සනාව දරන කෙනා, ඇතුලත් පිටතත් සෑම ධර්මයක්ම බිඳී බිඳී යනවා කියලා දකින්නා වූ කෙනාට ඒ ශරීරයට ලෙඩක් හැදුනයින් පස්සේ එයා ග්‍රහ අපල මංගල සාස්තර බල බල ඉන්නේ නෑ. එහෙම කරනවා කියලා කියන්නේ එයාගේ කැඩි කැඩී - බිඳි බිඳී යන නාම රූප ධර්ම තව දුරටත් දික් ගස්සා ගන්න දරන උත්සාහයක්. ඒකට කියන්නේ ජීවිත ආසාව කියලා. අධිපඤ්ඤාව තිබෙන්නා වූ කෙනාට ඒ ආසාව නැති වෙනවා. එයා මරණයට බයත් නෑ.

<u>ප්‍රශ්නය</u> - එයා බෙහෙත් ගන්නවද?

<u>පිළිතුර</u> - බෙහෙත් හේත් ගන්නවා. බුදුරජාණන්වහන්සේත් රහතන්වහන්සේලාත් අනිත් ස්වාමීන්වහන්සේලාත් බෙහෙත් පාවිච්චි කළා. එහෙම කළේ මනසිකාරය පවත්වාගෙන යන්න පහසුව හදාගන්න මිසක වැඩි පුර ජීවත් වෙන්න නොවෙයි. ඒක pain killers ගන්නවා වගේ දෙයක්. කථාවක් තිබෙනවා රත්තරන් දාල බෙහෙතක් හදනවා කියලා දීර්ඝායුෂ ලබන්න. විපස්සනා කරන කෙනෙකුට ඒ ගැන අහන්න ලැබුණත් එයා ඒක හොයාගෙන යන්නේ නෑ. ඒකයි ජීවිත ආසාව නෑ කියලා කියන්නේ.

<u>මෙනෙහි කිරීම</u>

මේ මෙනෙහි කිරීම කියන වචනය ඇහුනහම මොකක්ද හිතෙන්නේ? අපි මේ වචනය නිතර පාවිච්චි කරනවා. නමුත් සමහර අයට ඒ මොකක්ද කියලා හිතා ගන්න බෑ. සමහර වෙලාට හිත හිතා මතක් කරනවා වගේ අදහසක් එන්නේ. භාවනාවේදී මෙනෙහි කරනවා කියලා කියන්නේ ඒක හිත හිතා හිතින් සලකාගෙන යන එකට. යම්කිසි අරමුණක් මෙනෙහි කරන්න කියලා කිව්වහම ඒකෙන් කියන්නේ ඒ අරමුණ පිළිබඳව හිත හිතා - හිත හිතා යන එක, මතක් කරනවා කියන එක නොවෙයි.

<u>ප්‍රශ්නය</u> - සාස්වත දෘෂ්ඨිය සහ උච්ඡෙද දෘෂ්ඨිය...? (ප්‍රශ්නය පැහැදිලිව ඇහෙන්නේ නෑ)

<u>පිළිතුර</u> - සාස්වත දෘෂ්ඨිය කියලා කියන්නේ පුද්ගලයෙක් - ආත්මයක් - සත්වයෙක් - කෙනෙක් - පේන විදියට ඉන්නවා - නොපෙනෙන විදියට ඉන්නවා - සියුම් හැටියට ඉන්නවා - ඇඟ ඇතුලේ ඉන්නවා - ඇඟෙන් පිට ඉන්නවා නැත්නම් ඇඟේම බද්ධ වෙලා ඉන්නවා කියලා මේ විදියට නා නා ප්‍රකාර අදහස් තියාගෙන සත්ව පුද්ගල ගතිය තියාගෙන ඉන්න එකට.

ඊළඟට, තවත් විදියක් තිබෙනවා. මෙහෙම සත්වයෙක් ඉන්නවා කියලා කියනවා නම් එහෙම සත්වයෙක් නෑ කියන එක තමයි අනිත් පැත්ත. සමහර අය පිළිගන්නවා එහෙම මොකක්වත් නෑ, මරණින් පස්සේ උපදින කෙනෙකුත් නෑ, මේ ජීවිතිය ඉවර උනාට පස්සේ ඉවරයි කියලා. ඒ විදියට

පිළිගන්න එකට කියනවා **උච්ඡේද දෘෂ්ඨිය** කියලා. **'ඡේද'** කියලා කියන්නේ කැඩෙනවා කියන එක. ඒ අය හිතනවා මේ මරණයෙන් පස්සේ ඉවරයි නැවතත් ඉස්සරහට ගෙනියන්න එකක් නෑ කියලා. ඒ විදියට පිළිගන්න එකට කියනවා **උච්ඡේද දෘෂ්ඨිය** කියලා.

පටිච්චසමුප්පාදය දිහා බැලුවහම මේ දෘෂ්ඨි නැති වෙලා යනවා. එතකොට සාස්වත දෘෂ්ඨියේ ඉන්නෙත් නෑ, උච්ඡේද දෘෂ්ඨියේ ඉන්නෙත් නෑ.

<u>ප්‍රශ්නය</u> - ආවජ්ජන කියලා කියන්නේ මොකක්ද?

<u>පිළිතුර</u> - ආවජ්ජන කියලා කියන්නේ 'හිත හිතා යනවා' කියන එක. මෙනෙහි කරනවා කියන්නෙත් ඒක.

පාලියෙන් තිබෙනවා **ආවජ්ජන** කියලා වචනයක්. ඒක අපි සිංහලට පරිවර්තනය කරනවා **ආවර්ජනය** කරනවා කියලා. ඒකම තමයි මෙනෙහි කරනවා කියලා කියන්නේ. විවිධ විවිධ වෙනස් වචන නමුත් අදහස සමානයි. ඒකෙන් කරන්නේ එකයි. අනිත් එක තමයි අනුපස්සනාව. අනුපස්සනාව කියලා කියන්නේ 'අනු - අනු - පස්සති' = කොටස් කොටස් දිගට දිගට බලනවා කියන එක තමයි අනුපස්සනාව කියලා කියන්නේ.

තව එකක් තමයි emptiness කියන වචනය. බටහිර අය ඒ වචනය පාවිච්චි කරන්නේ සිතට සිතුවිලි එන්නෙත් නැති - මෙනෙහි කරන්නෙත් නැති - සිහියකුත් නැති - මොකක්වත් නැති - නින්ද ගිහිල්ලා වැනි අවස්ථාවකට. නොසිතා ඉන්න ඒකත් ඒකෙ කොටසක්. නමුත් emptiness කියන්නේ ඒක නොවෙයි. අපි හිතමු මේ ගේ ශූන්‍යයි කියලා. ඒ කියන්නේ හිස් ගෙයක්. මේ ගේ හිස් උනාට හිස් නැති කමකුත් එතැන තිබෙනවා. ඒ තමයි 'ගේ' කියන එක තිබෙනවා. නමුත් ඒ ගේ ඇතුලේ ශූන්‍යතාවයක් තිබෙනවා. ගේ හිස් කියලා කියන්නේ ගේ ඇතුලේ මුකුත් නෑ කියන එක, නමුත් එතැන 'ගෙයක් නෑ' කියලා කියන්නේ නෑ. ඒකයි වෙනස. ඒවගේ සංස්කාරයෝ ශූන්‍යයයි කියලා කියන්නේ අපි හිතාගෙන ඉන්න දෙයක් ඒකෙ නෑ කියන එක, නමුත් සංස්කාර ටිකක් නම් තිබෙනවා. සුඤ්ඤාගාරය කියලා කියන්නේ එතැන මිනිස්සු නෑ කියන එක. නමුත් 'ගාරය' කියන එක තිබෙනවා. එහෙම නැත්නම් සුඤ්ඤාගාරය කියලා කියන්න බෑ. අපි කියනවා 'හිස් භාජනය' කියලා. ඒකෙන් කියන්නේ භාජනයේ මුකුත් නෑ කියලා නමුත් 'භාජනය නෑ' කියලා කියන්නේ නෑ. ශූන්‍යයයි කියලා කිව්වහම ගොඩක් අය තේරුම් ගන්නේ මොකක්වත් නෑ කියලා. නිවනේ තමයි මොකක්වත් නැත්තේ. නිවනේ නිවිච්ච ගතිය තිබෙනවා, සන්සුන් වෙච්ච ගතිය තිබෙනවා. නිවනේ සත්වයෝ පුද්ගලයෝ නෑ. පරම ශූන්‍යතාවය කියන්නේ එතැන.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ශූන්‍යතාවය අරමුණු වෙන්නේ මාර්ග සිත් වලට පමණයිද?

<u>පිළිතුර</u> - නිවන කියන පරම ශූන්‍යතාවය, අසංඛ ධාතුව අරමුණු වෙන්නේ මාර්ග සිත් වලට. මාර්ග සිත් වලින් එහා පැත්තට හැරිලා නිර්වාණ ධාතුව දකින්න කලින් පටිපදා ඤාණදස්සන විසුද්ධිය කියලා එකක් තිබෙනවා. පටිපදා ඤාණදස්සන විසුද්ධියෙන් සංස්කාරවල තිබෙන්නා වූ බොරුව බල බලා බල බලා ගිහිල්ලා සංස්කාර ටිකක් විතරක් තිබෙනවා නමුත් සත්වයෝ පුද්ගලයෝ නෑ, සංස්කාර වල සත්වයෝ පුද්ගලයෝ නැති නිසා ඒවා ශූන්‍යයයි කියලා දැකලා තිබෙනවා. නමුත් ශූන්‍යතාවය පෙනුණ ඒ හිත් වලට 'නිවන' පෙනුණේ නෑ.

විදර්ශනා කරනකොට සත්වයෝ පුද්ගලයෝ නැති කමක් පෙනුණා. නමුත් ශූන්‍ය වෙච්ච් නැති එකකුත් එතැන තිබුණා. ඒ තමයි සංස්කාරයෝ ටික. සංස්කාරයෝ තිබෙන නිසා තමයි පේන්නේ,

සංස්කාරයෝ තිබෙන නිසා තමයි මෙනෙහි කරන්නේ. මේ විදර්ශනා අවස්ථාවේදීත් ශූන්‍යතාවයක් දකිනවා. සඞ්ඛාර උපෙක්ඛාවට යනකොට ඒ හිත සත්වයෙක් පුද්ගලයෙක් හැටියට කිසිදෙයක් බාර ගන්නේ නෑ. සංස්කාරයන්ගේ ශූන්‍යතාවය දැක දැක ඉදීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි මාර්ග සිත් පහළ වෙන්නේ. ඒකෙන් තමයි නිවන දකින්නේ. ඒක නිසා මුලින් ඇතිවූ සිත් වලත් ශූන්‍යතාවය දකින එකක් තිබෙනවා. මාර්ග සිත් වලින් කරන්නේ ඉස්සෙල්ලා දැක දැක හිටපු ශූන්‍යතාවය නිවනට බර කරලා තහවුරු කරන එක.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දුකුළා ඇවැත් කියන්නේ මොකක්ද?

<u>පිළිතුර</u> - දුකුළා ඇවැත් කියන්නේ දුෂ්කට කියන එකයි. ඒකට දුෂ්කෘත කියලා කියනවා. ඒ කියන්නේ 'නොමනා විදියට කරන ලද' කියන එක. ඒක පොඩි ආපත්ති කොටසක්. බුදුරජාණන්වහන්සේගේ දේශනාවේ ආපත්ති තිබෙන්නේ levels වලින්. මේ වගේ levels හතක් තිබෙනවා. ඒකේ පළවෙනිම එක තමයි සතර පාරාජිකාව. ජීවිතාන්තය දක්වා ඒවා නූලට ආරක්ෂා වෙලා තිබෙන්න ඕනෑ. ඊළගට දෙවෙනි තුන්වෙනි හතරවෙනි පස්වෙනි හයවෙනි හත්වෙනි කියලා තිබෙනවා. ඒකෙ දුෂ්කට යන්නේ පහළ පන්තියට. ඒ දුෂ්කෘත පොඩි ඒවා. ඒවා රහතන්වහන්සේ නමකට උනත් වෙන්න පුළුවන්. ඒකෙදී කරන්න තිබෙන්නේ 'මට මෙහෙම පොඩි දෙයක් සිද්ධ උනා' කියලා සංඝයාට දැනුම් දීම තුල අවංකත්වය ඉදිරිපත් කිරීම.

දැන් මම ඇවිදලා ඇවිදලා එනවා. එතකොට ඇඟේ දාඩිය තිබෙනවා. දාඩියත් එක්ක මම පුටුවට අත තියනවා. එතකොට පුටුවේ දාඩිය වදිනවා. එහෙම දාඩිය වදින්න හොඳ නෑ. ඒකට හේතුව, ඒ පුටුව අයිති මට නොවෙයි. ඒක අයිති සංඝයාට. සංඝයාගේ දෙයක් මගේ දහඩියෙන් අපිරිසිදු කළා කියන එක වරදක්. ඒක දුෂ්කටයක්. ඒවගේ පොඩි පොඩි ඒවා තිබෙනවා. ඒවගේම පළවෙනි අවුරුදු 5 තුල අපි කෙස් රැවුල් බාන කොට අපේ ගුරු ස්වාමීන්වහන්සේගෙන් අවසර අරගෙනම කරන්න ඕනෑ. එහෙම කළේ නැත්නම් දුෂ්කටයි. ඒවගේ පොඩි දේවල් තිබෙනවා. හැබයි ඒ වරද පුංචි උනාට ඒ වරද පුංචියි කියලා හිතන්න එපා කියලා තිබෙනවා. හේතුව, නැවක යනකොට පොඩි සිදුරක් හැදෙනවා. ඒ සිදුරෙන් වතුර එනවා. ඒ සිදුර පුංචියි කියලා නොසලකා හැරියොත් ඒක ලොකු වෙනවා. එතකොට එතැනින් වතුර ඇවිල්ලා නැව ගිලෙන්න පුළුවන්. ආන්න ඒක නිසා වරද පොඩියි කියලා හිතන්න එපා කියලා තිබෙනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස විසාඛාව ඇඬුවේ ඇයි?

<u>පිළිතුර</u> - විසාඛාව ඇඬුවේ ලෝභය නිසා. විසාඛාවගේ මිණිබිරිය නැති උනා. එයා මිණිබිරියට ආසයි, ස්නේහවන්තයි. ඒ ස්නේහවන්ත දේ තමන්ගෙන් නැති උනා. ප්‍රිය වස්තුවක් අයින් උනා. ඒ ප්‍රිය වස්තුව නැතිවීමේ ගැටීම තමයි ද්වේශය කියලා කියන්නේ. නමුත් මේ ද්වේශය සෝකයක් හැටියට ආවේ ලෝභය නිසා. ඒක නිසා තමයි එයා ඇඬුවේ.

<u>ප්‍රශ්නය</u> - සක්කාය දිට්ඨිය ඕකට බලපානවද?

<u>පිළිතුර</u> - නෑ, සක්කාය දිට්ඨිය කියන්නේ වෙන එකක්. විසාඛා තමන්වත් ඒ මිණිබිරියවත් සත්වයෙක් හැටියට බාර ගන්නේ නෑ. ඒ උනාට ඒ ළඟින් හිටපු කෙනා, හිතින් බැඳිලා හිටපු කෙනාව අයින් උනහම එයාට දුකක් ඇති උනා. ඒ දුක ඇතිවෙන ගතිය නැති වෙන්නේ අනාගාමී උනහමයි.

සෝවාන් වෙන අවස්ථාවේදී සහමුලින්ම නැති වෙන්නාවූ ක්ලේශ ධර්ම තමයි සක්කායදිට්ඨි - විචිකිච්ඡා - සීලබ්බත පරාමාස. මේවා නැති උනහම ඒ හිත මේ කිසිම සංස්කාරයක් පරමාර්ථ වශයෙන් සත්ව

පුද්ගලයෝ ඉන්නවා කියලා බාර ගැනීමෙන් තොර වෙනවා. නමුත් ජීවත් වෙලා ඉන්න නෑදෑයෝ සියලු දෙනාම මගේ සිතේ බන්ධනයෙන් නිදහස් කරනවා කියලා එකක් වෙන්නේ නෑ, මමායනය කරනවා කියන එකෙන් මිදෙන්නේ නෑ. එයා කළේ සක්කායදිට්ඨිය හැටියට තිබ්බ්ච දෘෂ්ඨිය නැති කළ එක පමණයි. නමුත් මමත්වයෙන් බාරගෙන තිබෙන වස්තු බිඳෙනකොට කැඩිලා අයින්වෙලා යනකොට හිතේ සෝකය ඇතිවෙනවා. ඒකත් වෙන්නේ බැඳීම වැඩියෙන් තිබුණොත් තමයි. විසාඛාවට ඇලීම ටිකක් වැඩියෙන් තිබුණ කෙනෙක්. එයා හොඳ ලස්සනට අඳින පළඳින කෙනෙක්. හොඳ හැඩකාර කාන්තාවක්. එයාගේ පළඳනාවල් ගෙනියන්නත් වෙනම සේවිකාවෝ ඉන්නවා. එයා තිබෙන ඒවා පාවිච්චි කරනවා නමුත් සත්ව පුද්ගල වශයෙන් බාර ගැනීමකුත් නෑ. අනිත් එක විසාඛාව සම්පත් නැති එක්කෙනෙකුත් නොවෙයි. අන්න ඒ වගේ චරිතයක් තමයි ඔය විසාඛාව. එයා හරි ඥානවන්තයි. ඒ අය ගොඩක් පිං කරපු අය. සංසාරයේ ඉන්නත් කැමතියි. ඒ කැමැත්ත තද බල විදියට තිබෙන නිසා තමයි ටික ටික ගිහිල්ලා බ්‍රහ්මලෝක හරහා නිවන් දකින්න සෝවාන් වෙලා යන්නේ ඒ විදියටයි.

සෝවාන් වූ අයට කාම රාගය තිබෙනවා, තරහ යන ගතිය තිබෙනවා. හැබැයි ඒ අයට කාම රාගය තිබුණා කියලා අනිත් අයට වගේ හොරෙන් ගන්න ඒවා, කැමට ගියහම අනිත් අයට කලින් මම ගන්න ඕනෑ කියලා එහෙම ඒවා නෑ. ඒ අය නොකා නොබී ඉන්නෙත් නෑ. ඒකෙ තිබෙනවා හරි moderate ගතියක්. ඒ අයට තිබෙනවා මමඞ්කාර කියන 'මම' කියන ගතිය. ඒක නැති වෙලා නෑ.

හොඳයි හැම දෙනාටම ධර්ම අවබෝධය වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

සාධු ! සාධු! සාධු !

ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි